සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය (සැකසුම -ඩබ්ලිව් .සී.සමරසිංහ )

අගෝස්තු මාසය - 1 සතිය          පුනරීක්ෂණ අංක 1

1)සුදුසු කර්ම කාරක ආඛ්‍යාත පද යොදන්න

1.ජනාධිපතිතුමා විසින් ජාතිය ..........   2.මා විසින් වැඩ ................   3.දෙමාපියන් විසින් නුඹලා .............
4.අප විසින් පොත් ..................   5.යහළුවන් විසින් අපි හඳුනා ගනු ..................

( කෙරිණි , බැලෙයි , ලැබුවෙමු , රැකුණෙහු , ඇමතිණි)   ( 2×5 )

2)කෙටි පිළිතුරු සපයන්න

1.සිංහල පුවත්පත් කලාවට කුමාරතුංග මුනිදාස මහතා අතින් සිදු වූ සේවය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න

2.ළමා සාහිත්‍යයට නිරන්තරයෙන් වස්තු විෂය වූ ‘අම්මා’ පිළිබඳ කර ඇති නිරමාණයක් උපුටා දක්වන්න.

3.ආනන්ද කුමාරස්වාමි පෙර’පර දෙදිගෙහි ගෞරවාදරයට පාත්‍ර වීමට හේතු මොනවා ද?

4.දේශාභිමානය ජනනය වන ගීතයක් උපුටා දක්වන්න.

5.ස්ටීවන් හෝකින් චරිතය පිළිබඳ ඔබට ඇති වන හැඟීම් කිහිපයක් ලියන්න.   ( 5×5 )

3)මෙම වාක්‍ය නිවැරදි කරන්න

1.හරක් රංචුව තණකොළ බුදියි.   2.දරුවන් ගෙදර සිටිති.   3.දියණියෝ පන්සලට ගියා ය.

4.කෙනෙක් නිරෝධායන මධ්‍යස්ථානවල සිටියි.   5.තෙරුන් වහන්සේ දහම් දෙසුවේ ය.   ( 2×5 )

4)ඔබ ප්‍රදේශයට මහඟු සේවයක් කළ දේශපාලනඥයෙකු වෙනුවෙන් ගුණ සමරු උලෙළක් සංවිධානය කර ඇත. ඒ සඳහා මැතිඇමතිවරුන්ට සහභාගී වන ලෙස දන්වා ආරාධනා පත්‍රයක් සකසන්න.   ( 15 )

5)මෙම වාක්‍යාංශ සඳහා තනි පද ලියන්න

1.වනයෙහි හැසිරෙන   2.මඩෙහි උපන්   3. පාද සතරක් ඇති   4. කෙනෙක් උපන් බිම

5.තමා ගැන පමණක් සිතා කටයුතු කරන   ( 1×5 )

6)උදය සුපිපුණු  මලක්   බඳු   * මෙම ගීත කණ්ඩයේ විරිතට අනුව තවත් ගීත කණ්ඩයක්

ළපටි අතපය හුහක්   මෘදු   නිර්මාණය කරන්න.

අම්ම හරි ආදරෙන්   හැදූ

7)රචනය - ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතු ව කටයුතු කරමු.   ( 25 )